Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**8 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **40 S I,II**

# පෙරදිග සංගීතය

කාලය පැය දෙකයි

නම / විභාග අංකය : ..............................................................................................................

**සැලකිය යුතුයි :-** • අංක 1 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. බිලාවල් රාගයට අදාළ ස්වර සංගති විදහා දක්වෙන ස්වර ස්ථාපන ගීතයකි,
    01. පොත පත කියවා. 02. සැපරිසි දී නෙක. 03. සිරස නමමු මව් පොළවට. 04. වදිමු සුගත සාක්‍ය සිංහ.

02. ''සරිගපධස'' ලෙස ආරෝහණ ස්වර යෙදෙන රාගයට අදාළව නිර්මාණය වූ ස්වර ස්ථාපන ගීතයකි,
    01. සවන පිනන ගීත මිහිර. 02. ඇහැල මහට ඇහැල ගහක. 03. සඳවති හිනහෙනවා. 04. කඳුපෙළ අතරේ.

03. ''සිරිසාර අතිශාන්ත'' නැමැති ගීතයේ යෙදෙන කෝමළ ස්වර වන්නේ,
    01. රි ධ. 02. ග ධ. 03. ග නි. 04. ග ම.

04. මාත්‍රා 2/3 වශයෙන් මත්කැටි යෙදෙන හින්දුස්ථානි ජප් තාලයට හිමි මාත්‍රා සංඛ්‍යාව,
    01. 08 කි. 02. 10 කි. 03. 14 කි. 04. 06 කි.

05. හින්දුස්ථානි තාලයක යෙදෙන තාලස්ථාන අතුරින් වඩාත් ප්‍රබල හා ප්‍රාණවත් ආඝාත ස්ථානය ලෙස ගැනෙනුයේ,
    01. බලිය යි. 02. සමග්‍රහය යි. 03. අනුතාල යි. 04. යේබාව යි.

06. 6/8 ලෙස දක්වෙන තාලයට අනුරූපව මාත්‍රා බෙදා ඇති ස්වර කොටස වන්නේ,
    01. සගපග / ධපගරි ස්වර කොටසයි. 02. ගමප ප්‍රප- / ගමප - ප- ස්වර කොටසයි. 03. ධපධ / ස-රි ස්වර කොටසයි. 04. ගරි/ නිරි / ගරි / ස- / ස්වර කෙටසයි.

07. ''රවි ශංකර්'' නැමැති ඉන්දියානු සංගීතඥයා ලෝක ප්‍රකට වාදකයකු ලෙස ජනප්‍රිය වන්නේ කිනම් සංගීත භාණ්ඩයක් වාදනය සඳහාද?
    01. ගිටාරය. 02. සර්පිනාව. 03. සිතාරය. 04. තබ්ලාව.

08. ''නායකී'' තාර් යනුවෙන් හැඳින්වෙන්නේ කුමන සංගීත භාණ්ඩයක ප්‍රධාන තතද?
    01. වයලීනයේ. 02. සිතාරයේ. 03. එස්රාජයේ. 04. වීණාවේ.

09. අඑව හෙවත් ''BOW'' උපයෝගි කර ගනිමින් වයනු ලබන ශාන්ති නිකේතනයේ වඩාත් ප්‍රචලිත වූ සංගීත භාණ්ඩයක් ලෙස සැලකෙන්නේ,
    01. වයලීනය යි. 02. සිතාරය යි. 03. චෙලෝ වයි. 04. එස්රාජය යි.

10. මන්ද්‍ර ම ස්වරයට ප්‍රධාන තත සුසර කරනු ලබන සංගීත භාණ්ඩයකි,
    01. වයලීනය. 02. ගිටාරය. 03. සිතාරය. 04. වියෝලාව.

11. සරල ගීතයක දෙවන කොටසට පහසුවෙන් අවතීර්ණ වීමට හැකි සේ මුල් කොටස හා දෙවන කොටස අතර සිදු කෙරෙන අතුරු වාදනය,
    01. VERSE ලෙස හැඳින්වේ. 02. BIT ලෙස හැඳින්වේ. 03. INTERLUDE ලෙස හැඳින්වේ. 04. SONG ලෙස හැඳින්වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

12. හින්දුස්ථානි රාගධාරි සංගීතයට අයත් සරල ශාස්ත්‍රීය ගායනා අංගයක් ලෙස නම් කළ හැකිය.
    01. තිලානා 02. භජන් ගී 03. දැල් ගී 04. බැති ගී
13. ඉන්දියාවේ බෙංගාල ප්‍රදේශයේ පවතින රබීන්ද්‍ර ගී හෙවත් වංග ගීත නිර්මාතෘ ලෙස හැඳින්වෙන්නේ,
    01. අමීර් කුෂ්රූ 02. රවි ශංකර්
    03. රබීන්ද්‍රනාත් තාගෝර් තුමා 04. භාත්ඛන්ඩේ පඬිතුමා
14. දයාව කරුණාව යන හැඟීම් ඉස්මතු කොට දැක්වෙන සාර්ථක මව්ගුණ ගීතයක් ලෙස ගත හැකි ''සොම්නස හෝ සන්තාපය හමුවේ'' නම් ගීතය ගයනු ලබන්නේ,
    01. ඩබ්.ඩී.අමරදේව මහතා ය. 02. සනත් නන්දසිරි මහතා ය.
    03. සුසිල් ප්‍රේමරත්න මහතා ය. 04. වික්ටර් රත්නායක මහතා ය.
15. නූර්ති ගීත ගායනයේදී විශේෂයෙන් යොදා ගන්නා ස්වර වාද්‍ය හා තාල වාද්‍ය භාණ්ඩ යුගලය,
    01. වයලීනය හා ගැටබෙරය යි 02. වයලීනය හා මද්දලය යි
    03. තබ්ලාව හා වයලීනය යි 04. සර්පිනාව හා තබ්ලාව යි
16. නූර්ති හා නාඩගම් නාට්‍ය ශෛලීන් සඳහා ආභාෂ කොට ගත් සංගීත සම්ප්‍රදායන් පිළිවෙලින්,
    01. කර්ණාටක හා බටහිර 02. කර්ණාටක හා හින්දුස්ථානි
    03. හින්දුස්ථානි හා කර්ණාටක 04. අපරදිග - හින්දුස්ථානි
17. මද්දලය නැමැති තාල වාද්‍ය භාණ්ඩයෙන් පමණක් වාදනය කළ හැකි තාල පදය වන්නේ,
    01. ගුදගුද / ගදිගත 02. දිගුද / ගුදං
    03. දිකුංතා / -කුදොං 04. දොම් / කිත / කිත / දොම්
18. පහත ගීත අතුරින් නව නාට්‍ය ගීතයක් නොවන්නේ,
    01. මුදු පතුල යට ඉඳලා 02. අන්න බලන් සඳ
    03. ඇහැල මලින් ගස් පිරිලා 04. බෝ දොස් කියා
19. පැදිපාදයකට හිමි ලඝු ගුරු අක්ෂරවල එකතුව,
    01. ගුරු මාත්‍රාවේ 02. සඳැස්මත්වේ
    03. ගීමත්වේ 04. ලඝුමත් වේ
20. බටහිර සංගීත ප්‍රස්තාරකරණයේදී මාත්‍රා දෙකක් හා එක් මාත්‍රාවක් දැක්වීම සඳහා යොදා ගන්නා සංකේත හැඳින්වෙන නාම වන්නේ,
    01. ක්‍රොචට් / සෙමිබ්‍රිව් 02. ක්‍රොචට් / ක්වේවර්
    03. මිනිම් / ක්‍රොචට් 04. සෙමිබ්‍රිව් / ක්‍රොචට් (ලකුණු 1x20=20)

## II කොටස

- පළමු ප්‍රශ්නය ට පිළිතුරු ලිවීම අනිවාර්යය වේ.
- සෙසු ප්‍රශ්න වලින් දෙකක් තෝරා ගෙන සම්පූර්ණ ප්‍රශ්න තුනක් වන සේ පිළිතුරු සපයන්න.

01. a) ගමප/ගමරි/සරිග/රිසස b) ṡṡධ/පගග/රිගරි/සසරි
    i. ඉහත ස්වර ප්‍රස්තාර වලින් දැක්වෙන ගීත යුගලයට අයත් පද කොටස වෙන් වෙන්ව ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 02)
    ii. ඔබ උගත් කෝමළ <u>ගනි</u> ස්වර යෙදෙන රාගයක් නම් කර එම රාගයේ ආරෝහණ අවරෝහණ ස්වර ලියා දක්වන්න. (ලකුණු 02)
    iii. මාත්‍රා 3/4 වශයෙන් විභාග වන හින්දුස්ථානි තාලය නම් කර එම තාලයේ මාත්‍රා සංඛ්‍යාව ලියා දක්වන්න. (ලකුණු 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iv. ''මිස්රාබ්'' නැමැති උපකරණය භාවිත කොට වයනු ලබන සංගීත භාණ්ඩය නම් කර එය අයත් වන සංගීත සම්ප්‍රදාය නම් කරන්න. (ලකුණු 02)

v. හින්දුස්ථානි ගායන ශෛලීන් වන භජන් ගී හා රවීන්ද්‍ර ගී පිළිබඳව ඔබ උගත් කරුණු එක බැගින් ලියා දක්වන්න. (ලකුණු 02)

02. i. කාෆි රාගයට අදාළ ස්වර ස්ථාපන ගීතයක් නියමිත තාල සංඥා යොදා ගීත ස්වර ප්‍රස්තාර කරන්න. ( ල. 4)

ii. ''ගැමි ගී'' යන්න නිර්වචනය කර ගැමිගීයේ සුවිශේෂි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 04)

iii. ගොයම් හෝ කමත් ගී පිළිබඳව කරුණු දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)

03. i. නූර්ති, නව නාට්‍ය, යන රංග ශෛලින් නිර්මාණයට දායක වූ නිර්මාතෘවරුන් දෙදෙනෙකු නම් කොට, ඔවුන් නිර්මාණය කළ නාට්‍ය දෙකක් හා ගීත දෙකක් නම් කරන්න. (ලකුණු 03)

ii. ''කොබෝ කුරුළු වනේ'' මෙම ගී පාදයේ ඇති සැදැස්මත් ගණන හා ගීමත් ගණන වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 03)

iii. ''යතිය'' යන්න නිර්වචනය කර යතිය සහිත ගී පාදයක් ලියා දක්වන්න. (ලකුණු 04)

04.

1 2 / 3 4 5 / 6 7 / 8 9 10

X X / X X - / X - / X X -

X - / X X X / X X / X X -

i. ඉහත රිද්ම රටාවට ගැළපෙන සේ ස්වර ඛණ්ඩයක් නිර්මාණය කර ප්‍රස්තාර කර දක්වන්න. (ලකුණු 04)

ii. a) මොර හිඹුටු දම් පනා b) උදුල තරු වැල වතල සොඳුරු

ඉහත ගී පාද දෙක, දේශීය තිත් රූප අනුව ප්‍රස්තාර කරන්න. එම තිත් රූප දෙක නම් කරන්න.(ලකුණු 04)

iii. ''මව් සෙනෙහස'' මැයින් මව්ගුණ කියවෙන සේ, පේළි 4 කට නොඅඩු ගී පද මාලාවක් නිර්මාණය කරන්න. (ලකුණු 02)

05. i. පහත දී ඇති බටහිර සංගීතයට අදාළ ස්වර වල වටිනාකම් හා සංකේත යොදා වගුව සම්පූර්ණ කරන්න.

| වර්ගය | සංකේතය | වටිනාකම |
|---|---|---|
| සෙමිබ්‍රිව් | | |
| මිනිම් | | |
| ක්‍රොචට් | | |
| ක්වේවර් | | |

( ලකුණු 1/2x 8=4)

ii. සරල ගීතයක් නිර්මාණය කිරීමේදී එහි ආකෘතිය දැක්වෙන කොටස් ලියා දක්වන්න. ( ල. 04 )

iii. ඔබ උගත් කිතුණු බැති ගීතයක පේළි දෙකක් පද ප්‍රස්තාරය කර දක්වන්න. (ලකුණු 02)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**8 ශ්‍රේණිය**

# වර්ෂ අවසාන පරීක්ෂණය - 2019

## පෙරදිග සංගීතය - I පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 01. 3 | 02. 2 | 03. 3 | 04. 2 |
| 05. 2 | 06. 2 | 07. 3 | 08. 2 |
| 09. 4 | 10. 3 | 11. 3 | 12. 2 |
| 13. 3 | 14. 3 | 15. 4 | 16. 3 |
| 17. 3 | 18. 4 | 19. 2 | 20. 3 |

(ලකුණු 1x20=20)

## II පත්‍රය

01. i. a) /සිරස/නමමු/මව්පො/ලොවට/
b) /ඇහැල/මහට/ඇහැල/ගහක/ (ල.02)

ii. කාෆි රාගය
ආරෝහණ :- සරිගමපධනිසං අවරෝහණ :- සංනිධපමගරිස (ල.02)

iii. දීප්චන්දි තාලය - මාත්‍රා 14 යි

iv. සිතාරය - හින්දුස්ථානි සංගීත පද්ධතිය

v. භජන් හා රවීන්ද්‍ර ගී පිළිබඳ ඕනෑම කරුණු එක බැගින් ලියා තිබීම ප්‍රමාණවත්ය (ල.02)

02. i. නියමිත තාල සංඥා යොදා නිවැරදිව කාෆි රාගයට අදාළ ස්වර ස්ථාපන ගීතයක් ලියා තිබිය යුතුය. (ල.04)

ii. ''ගැමියන් විසින් ගයන ලද ගී' ගැමි ගී වේ. ආදි වශයෙන් නිර්වචනය කර තිබීම.
ගැමි ගීයේ සුවිශේෂී ලක්ෂණ
- භාෂාව සරලය
- ස්වර සීමාව පට වීම.
- ගැමි වචන භාවිතය
- නිර්මාණකරුවෙක් නැත යනාදි වශයෙන් දැක්වීම.

iii. ගොයම් ගී හෝ කමත් ගී පිළිබඳව කරුණු 2ක් දක්වා තිබීම සෑහේ. (ල.02)

03. i. විෂය නිර්දේශයට අයත් නුර්ති හා නව නාට්‍ය ශිල්පීන් නම් කොට ඔවුන්ගේ නිර්මාණ එයට අදාල ඕනෑම ගීත දෙකක් නම් කර තිබිය යුතුය. (ල.03)

ii. සදෑස්මත් 09 ගීමත් 12 (ල.03)

iii. ''යතිය'' නිර්වචනය කර තිබීම හා යති සහිත ඕනෑම ගී පාදයක් ලියා තිබිම ප්‍රමාණවත්‍ය. (ල.04)

04. i. දී ඇති රිද්ම රටාවට ගැළපෙන සේ ඕනෑම ස්වර ඛණ්ඩයක් නිර්මාණය කර තිබීම. (ල.04)

ii. a) 1̂ 2 / 1́ 2 3 / 1̂ 2 / 1́ 2 3 /
මොර/ හිඹුටු/ දම් /පතා S /

b) 1̂ 2 3 / 1́ 2 3 4 / 1̂ 2 3 / 1́ 2 3 4 /
උදුල / තරුවැල/ වතල / සොඳුරුS/

a) සුළු මැදුම් දෙතිත
b) මැදුම් මහ දෙතිත (ල.04)

iii. "මව් සෙනෙහස" නමින් නිර්මාණය කරන ගීතය පාද හතරක්වත් වන සේ නිර්මාණය කර තිබිය යුතුය.(ල2)

05. i.

| | | |
|---|---|---|
| සෙමිබ්‍රිව් | 𝅝 | මාත්‍රා 4 |
| මිනිම් | 𝅗𝅥 | මාත්‍රා 2 |
| ක්‍රොචට් | ♩ | මාත්‍රා 1 |
| ක්වේවර් | ♪ | මාත්‍රා 1/2 |

(ල.1/2x8=4)

ii.

| | |
|---|---|
| තනුව | - Melody |
| පෙර වාදනය | - Introduction |
| ස්ථායි කොටස | - Song |
| අතුරු වාදනය | - Interlude |
| අන්තරා කොටස | - Verse |
| බීට්ස් | - Bit |
| කවුන්ටර් | - Counter |

(ල.04)

iii. කිතුණු බැති ගීයක පද පේළි දෙකක් පද ප්‍රස්තාර කර තිබීම සෑහේ. (ල.02)